# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1834/28 - 2013 ඔක්තෝබර් මස 30 වැනි බදාදා - 2013.10.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1992 අංක 01 දරන බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ (සංශෝධන) ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සහ 7(1) - (2) සහ 1993 අංක 3 දරන බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තියේ 5-6 වන වගන්තිය යටතේ වූ රීති

1992 අංක 01 දරන බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ (සංශෝධන) ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සහ 7(1) - (2) සහ 1993 අංක 3 දරන බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තියේ 5 - 6 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බස්නාහිර පළාත තුළ මගී ප්‍රවාහනයේ යොදවනු ලබන පාසල් ළමුන් ප්‍රවාහනය කරනු ලබන පෞද්ගලික වාහන සම්බන්ධයෙන් සාදනු ලැබ ඇත්තාවූ රීති පහත පරිදි බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. උපාලි කොඩිකාර,
ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා
කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම හා
බෙදා හැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය.

2013 ඔක්තෝබර් මස 10 වැනි දින.

මෙම "රීති පෞද්ගලික වාහන මගින්, පාසල් ළමුන් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් වන රීති" යනුවෙන් හඳුන්වනු ලබන අතර එකී රීති 2013 ඔක්තෝබර් 10 දින සිට බස්නාහිර පළාත තුල ක්‍රියාත්මක වන්නේය.

බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවාවන් විධිමත් කිරීමේ හා එම කාර්යට ආනුෂාංගික වන අනෙකුත් කාර්යන් සඳහා එකී විධිමත් කිරීමේ අරමුණු ඉටුකර ගැනීම උදෙසා බස්නාහිර පළාත තුළ පාසල් ප්‍රවාහන සේවා රථ ලෙස 1992 අංක 01 දරන බස්නාහිර පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ (සංශෝධන) ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සහ 7(1) - (2) සහ 1993 අංක 3 දරන බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තියේ 5 - 6 වන වගන්තිය යටතේ "බලයලත් වාහනය යන්නෙන් ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් මත මගීන් ගෙනයාම පිණිස පළාත තුළ ආරම්භ කරනු ලබන කවර වුවද වාහනයක් අදහස් වේ." යන විධිවිධානයට අනුව බස්නාහිර පළාත් පාසල් සේවා රථ සඳහා පහත රෙගුලාසි ක්‍රියාත්මක කරවීම.

01\. (අ) බස්නාහිර පළාත තුළ පාසල් ළමුන් ප්‍රවාහනය කිරීම සඳහා යොදා ගනු ලබන බස්රථ හෝ වෑන් රථ හිමියන් මගී ප්‍රවාහන සේවා අධිකාරිය වෙතින් වර්ෂයකට වරක් අවසර පත්‍රයක් ලබා ගත යුතුය. ඒ සඳහා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් නිකුත් කරන විධිමත් අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය ;

(ආ) බස්රථයක හෝ වෑන් රථයක් හිමිකරුවෙකු නොවන පුද්ගලයෙකු අයදුම්පතක් ඉදිරිපත් කර සිටියහොත් එම වාහනය පාසල් ප්‍රවාහනය සඳහා නීතිමය අවසරයක් වාහන හිමිකරුගෙන් ලබා ගෙන ඇති බවට අධිකාරිය සෑහීමකට පත්විය යුතුය. (අවසර පත්‍රයක ගාස්තුව අවසර පත්‍රය ලබා ගන්න අවස්ථාවේ දී ගෙවිය යුතුය.) ;

(ඇ) අවසර පත්‍රයක් හිමි වාහනයක් වාහන හිමිකරු විසින් දෙවන පාර්ශ්වයකට විකිණීමේදී එම අවසර පත්‍රය අදාළ පුද්ගලයාට පවරා දීම ගැන අධිකාරියට සලකා බැලිය හැකිය.
අවසර පත්‍ර නිකුත් කරනු ලබන්නේ වාහන හිමිකරුට වන අතර වාහන හිමිකරුම මෙම සේවාව පවත්වාගෙන නොයන අවස්ථාවල දී එම සේවාව පවත්වාගෙන යන දෙවන පාර්ශ්වයකට වාහන හිමිකරු විසින් බලය පැවරිය හැකි අතර ඒ අනුව එම සේවාව පවත්වාගෙන යන බලයලත් පුද්ගලයා හට අවසර පත්‍රය පවරා දීමට ප්‍රවාහන අධිකාරියට හැකියාව ඇත ;

(ඈ) අවසර පත්‍ර සඳහා වන ගාස්තු 1 වන උපලේඛනයෙහි දැක්වේ ;

(ඉ) පාසල් ප්‍රවාහන සේවාව පවත්වාගෙන යාමේ අවසර පත්‍රයක් නිකුත් කිරීම, අලුත් කිරීම, සංශෝධනය කිරීම හා අවලංගු කිරීම් පිළිබඳ සියලු බලතල ප්‍රවාහන අධිකාරිය සතු ය ;

(ඊ) අධිකාරිය විසින් කලින් කල පාසල් බස්රථ හා වෑන් රථ සේවාවන් පවත්වාගෙන යනු ලබන බස් හිමියන්ගේ බස්රථයකට හෝ වෑන් රථයකට සුදුසුකම් නියම කරනු ලැබිය හැකිය.

02. පාසල් සේවා අවසර පත්‍ර ගාස්තුව වර්ෂයකට කොපමණද යන්න තීරණය කිරීමේ බලය මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සතුය. කලින් කල ගාස්තු සංශෝධනය කිරීමේ දී පාසල් වෑන් රථ සමාගම් සමග සාකච්ඡා කර ඔවුන්ගේ එකඟතාවය ලබා ගැනීම සුදුසුය.

03. එම අවසර පත්‍රය අධිකාරියේ පරිපාලනය යටතේ ප්‍රවාහනය කරනු ලබන පාසල් බස්රථයක හෝ වෑන් රථයක තබා ගත යුතු අතර, ප්‍රවාහන අධිකාරිය විසින් එම අවසර පත්‍රයේ සටහන් කළ යුතු තොරතුරු කවරේදැයි නියමකළ යුතුය. එම අවසර පත්‍රය අධිකාරිය හෝ යම් බලයලත් නිළධාරියෙකු ඉල්ලා සිටිය විට ඉදිරිපත් කළ යුතුය.

04. බස්නාහිර පළාත තුළ පාසැල් සේවා පවත්වාගෙන යාමේ අවසර පත්‍රයක් නොමැතිව හෝ නීති විරෝධි ක්‍රියාවල යෙදීම සම්බන්ධයෙන් පාසල් බස්රථ හෝ වෑන් රථ සම්බන්ධයෙන් ලැබෙන පැමිණිවල දි ප්‍රවාහන අධිකාරියේ බලයලත් නිලධාරියෙකු හට එකී ක්‍රියාවන් සඳහා 1992 අංක 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තියේ 32, 33 වගන්තිය යටතේ කටයුතු කිරීමට බලය ඇත.

05. මුදල්මය වශයෙන් හෝ ද්‍රව්‍යමය වශයෙන් අධිකාරිය වෙත ලැබෙන යම් ප්‍රදානයන් බස්නාහිර පළාත තුළ පාසල් ප්‍රවාහන සේවා පවත්වාගෙන යාම සහ විධිමත් කිරීම සඳහා යොදා ගැනීමට ප්‍රවාහන අධිකාරියට කටයුතු කිරීමේ බලය ඇත.

06. මෙම සේවාව පොදු මහජනතාවගේ සේවාවක් වන හෙයින් වෑන් රථයක අසුන් ගැනීමේ පහසුව ඇතිව ප්‍රවාහන කළ යුතු අවම ළමුන් සංඛ්‍යාව 10ක් විය යුතු අතර, අසුන් ගැනීමේ පහසුව ඇතිව ප්‍රවාහනය කළ යුතු උපරිම ළමුන් සංඛ්‍යාව 30කට සීමාවිය යුතුවේ. නියම කරනු ලබන ළමුන් සංඛ්‍යාවට වඩා වැඩි සංඛ්‍යාවක් ප්‍රවාහනය කරනු ලබන පාසැල් බස් රථයක් හෝ වෑන් රථයක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් ලැබුණ විටකදී අධිකාරියේ බලයලත් නිලධාරියෙකු විසින් පරීක්ෂා කොට එම කරුණු තහවුරු වන අවස්ථාවල පාසල් බස් රථයක් හෝ වෑන් රථයක් අවසර පත්‍රය අවලංගු කිරීමට අධිකාරියට බලය ඇත.

07. අවසර පත්‍රයේ හිමිකරු අඛණ්ඩව පාසල් ප්‍රවාහන සේවාව පවත්වාගෙන යා යුතුය. එම සේවය අවසර පත්‍රය වලංගු වන දිනයේ සිට අවම වශයෙන් වසරක කාලයක් විය යුතුය.

08. අදාළ පාසල් ප්‍රවාහන සේවාව කරනු ලබන රථය සහ සියලුම ළමුන් සඳහා පූර්ණ රක්ෂණ ක්‍රමයක් පිළිගත් රක්ෂණ සමාගමක් හරහා ක්‍රියාත්මක කිරීමට අධිකාරිය මැදිහත් විය යුතුය.

09. ළමා අපචාර, මත් ද්‍රව්‍ය භාවිතය හෝ වෙනත් නීති විරෝධි ක්‍රියාවන් සිදු කරන පාසල් සේවා රථයන් හි සේවකයන්ට එරෙහිව පොදු නීතියට අනුව කටයුතු කිරීමට ප්‍රවාහන අධිකාරියට බලය ඇති අතර එවැනි රථයක අවසර පත්‍රය අහෝසි කිරීමට ද අධිකාරියට බලය ඇත.

10. බස්නාහිර පළාත තුළට ඇතුල් වන අන්තර් පළාත් පාසල් ප්‍රවාහන සේවා බස්රථයකටම හෝ වෑන් රථයකටම අනිවාර්යෙන්ම බස්නාහිර පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ අවසර පත්‍රයක් විය යුතුය.

11. අවසර පත්‍රයක් නොලබා පාසල් ප්‍රවාහන සේවාව පවත්වා ගෙන යනු ලබන බස්රථයක හෝ වෑන් රථයක හිමිකරුවෙකුට විරුද්ධව අධිකාරිය විසින් නීතිමය පියවර ගත හැක.

12. බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ අවසර පත්‍රයක් ලබා ඇති පෞද්ගලික මගී ප්‍රවාහන බස් රථ සේවාව හා පාසල් සේවා රථ වෙන් වෙන්ව ක්‍රියාත්මක විය යුතුය. නිත්‍ය මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් ලබා ඇති බස් රථ පාසල් ප්‍රවාහන සඳහා නොපැමිණිය යුතුය.

13. අවසර පත්‍රයක් නිකුත් කිරීමේ දී අධිකාරිය විසින් වාහනයේ තත්ත්වය පිළිබඳ පහත කරුණු සම්බන්ධව සෑහීමකට පත්විය යුතුය :-

(අ) පාසල් ප්‍රවාහන සේවාවක් බව වෙන් කර හඳුනාගත හැකි වීම. (ලියාපදිංචිය සනාථ කිරීම සඳහා ස්ටිකර් ඉදිරි හා පිටුපස විදුරුවල) ;

(ආ) වාහනයේ මනා ධාවන තත්ත්වය (පරීක්ෂණයේදී තීරණය කළ යුතුය.) ;

(ඇ) ආසන අතර පරතරය (පහසුවෙන් ඉදගෙන යාමේ හැකියාව) ;

(ඈ) ටයර්වල තත්ත්වය (වාර්ෂිකව බලපත්‍ර අලුත් කිරීමේදී, නව බලපත්‍ර දීමේ දී වාහන රථ ගාල්වලදී පරීක්ෂා කළ යුතුය) ;

(ඉ) තිරිංග පද්ධතියේ ස්වරූපය (වාර්ෂිකව බලපත්‍ර අලුත් කිරීමේදී, නව බලපත්‍ර දීමේ දී හා හදිසි පරීක්ෂණ වලදි පරීක්ෂා කළ යුතුය) ;

(ඊ) සවිකර ඇති ආරක්ෂක උපාංග (ප්‍රථමාධාර පෙට්ටිය, ගිනි නිවීමේ උපකරණ ආදිය) ;

(උ) දොරවල් අගුලු දැමීමේ හැකියාව තිබිය යුතුය. (කුඩා ළමුන් පමණක් ගමන් කරනවා නම්, සෙන්ටර් ලොක් එකක් තිබිය යුතුය.) ;

(ඌ) සංඥා විදුලි ආලෝක පද්ධතියේ තත්ත්වය ;

(ඍ) වාහනයේ පිරිසිදු බව ඉහළ තත්ත්වයක පැවැතිය යුතුය ;

(ඎ) පිටුපස පැති වීදුරු වාතාශ්‍රය ලැබිය හැකිව තිබීම (කට් ග්ලාස්) ;

(එ) හදිසි අවස්ථාවකදී/ජනෙල්/දොරටු විවෘත කළ හැකි වීම ;

(ඒ) වායු සමීකරණ තිබේ නම් වඩාත් යෝග්‍ය වේ ;

(ඔ) ප්‍රවාහනය කරන ළමයින්ගේ පාසල්වල නම් ප්‍රදර්ශනය කළ යුතුය ;

(ඕ) ප්‍රවාහනය කළ හැකි ළමුන් සංඛ්‍යාව (ඒ ඒ වාහන පන්තිවලට අනුව අනුමත සංඛ්‍යාව පමණක් විය යුතුය).

14. වාහනය නවතා තැබීමට ස්ථිර ස්ථානයක් නොමැතිනම් ඒ පිළිබඳව දෙමව්පියන්, භාරකරු හෝ පාසලේ පන්තිභාර ගුරුතුමා දැනුවත් කිරීම :-

(අ) ළමයින් පැමිණීම පිළිබඳ වාර්තාවක් තබා ගැනීම ;

(ආ) එක් වාහනයක සිට තවත් වාහනයකට ළමුන් හුවමාරු කර ප්‍රවාහනයේ යොදවන අවස්ථාවක සියලු වාහනවල රියදුරන් පිළිබඳ තොරතුරු දෙමව්පියන් හා පාසල වෙත දැනුවත් කිරීම.

15. වාහනයේ තිබිය යුතු නීතිමය ලියකියවිලි :-

| | |
|---|---|
| (අ) පූර්ණ රක්ෂණ ආවරණයක් තිබිය යුතුය. (ළමුන්ට 8 වන වගන්තියට අනුව රක්ෂණ ආවරණයන් අධිකාරිය විසින් ලබා දීම) ;<br>(ආ) එම වර්ෂයට අදාල ආදායම් බලපත්‍රයක් තිබීම ;<br>(ඇ) ලියාපදිංචි සහතිකය ; | වගකීම පොලීසිය |

(ඈ) පාසල් ප්‍රවාහන සේවය සඳහා වූ මාර්ග අවසර පත්‍රයක් තිබිය යුතුය ;

(ඉ) නියාමන ආයතනයක් විසින් ලබාගන්නා ලද යෝග්‍යතා සහතිකයක් ;

(ඊ) අධිකාරිය විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍ර ලේබලය වා මුවා වීදුරුවෙහි අලවා තිබිය යුතුය.

16. රියදුරන් සඳහා ප්‍රමිතීන් :-

(අ) වලංගු රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය. (අදාළ වාහන පංතියට අයත්) ;

(ආ) අවම වයස අවුරුදු 25ක් විය යුතුය ;

(ඇ) පළපුරුද්ද අවම වශයෙන් අවුරුදු 3ක් විය යුතුය. (නව ප්‍රවේශකයින් සඳහා පමණක් අදාළ වේ) ;

(ඈ) අදාළ පොලීසියේ පොලිස් වාර්තාව තිබීම (චරිතය හා අපරාධ පිළිබඳව) ;

(ඉ) ශාරීරික, මානසික, සෞඛ්‍ය තත්ත්වය සනාථ කිරීමට වෛද්‍ය සහතිකය තිබීම.

17. බලපත්‍රධාරියාගේ වගකීම :-

(අ) අදාළ නියාමන ආයතනයක ලියාපදිංචි වී තිබිය යුතුය ;

(ආ) පාසල් ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම ;

(ඇ) නියාමන ආයතනයේ ලියාපදිංචි රියදුරෙකු යෙදවීම ;

(ඈ) නියාමන ආයතනයේ කොන්දේසිවලට අදාළව වාහනයේ තත්ත්වය හා ස්වභාවය පවත්වා ගැනීම ;

(ඉ) කුඩා ළමුන් (වයස අවු. 8ට අඩු) ප්‍රවාහනය කරන වාහන සඳහා සහයිකාවකගේ සේවය ලබා ගැනීම ;

(ඊ) රිය අනතුරක් සිදු වී දින 01ක් ඇතුළත නියාමන ආයතනය දැනුවත් කිරීම ;

(උ) බරපතල හෝ මාරක රිය අනතුරක් සිදුවුවහොත් නැවත පාසල් ළමුන් ප්‍රවාහනය කිරීමට යෝග්‍යතා සහතිකයක් ලබා ගන්නා තෙක් වාහනය පාසල් ළමුන් ප්‍රවාහනය නොකළ යුතුය;

(ඌ) බරපතල හෝ මාරක රිය අනතුරක් සිදුවූ රියදුරෙකු සුදුසු සෞඛ්‍ය තත්ත්වයක සිටින බවට නියාමන ආයතනයෙන් පරීක්ෂණයක් සිදුකර සේවය ලබා ගැනීමට සුදුසු බවට සහතිකයක් ලබා ගන්නා තුරු නැවත සේවයේ නොයෙදීම ;

(එ) පාසල් ප්‍රවාහන සේවයේ යෙදෙන කාලය තුළ රියදුරු හෝ රිය සහයක/සහයිකාව මත්පැන්, මත් ද්‍රව්‍ය හෝ දුම්පානයෙන් වැළකිය යුතු බවට වග බලා ගත යුතුය ;

(ඒ) වාහනයේ රියදුරු හා සහයිකාව විනයගරුක හා සංවරශීලී හැසිර වීමට වග බලා ගත යුතු ය ;

(ඔ) වාහනයේ රියදුරු හා සහයිකාව සුදුසු ඇඳුමකින් සැරසී සිටිය යුතුය ;

(ඕ) ප්‍රවාහනය කරන ළමුන් පිළිබඳ සියලු විස්තර තමන් සතුව තිබිය යුතු වීම. (දෙමාපියන්ගේ හෝ භාරකරුගේ ලිපිනය, දුරකථන අංකය, පාසලේ නම, ලිපිනය, දුරකථන අංකය, විදුහල්පතිතුමාගේ දුරකථන අංකය) ;

(ක) සේවයේ යෙදී සිටින රියදුරු නොමැති විට සුදුසුකම්ලත් තාවකාලික රියදුරෙකු යෙදවිය හැකි අතර ඔහුගෙන් සිදුවන වැරදි සම්බන්ධ වගකීම බලපත්‍රධාරියා දැරිය යුතුය ;

(ඛ) කාර්මික දෝෂයක් මත වාහනය ධාවනය කළ නොහැකි විට පාසල හා දෙමාපියන් දැනුවත් කර සුදුසු පියවරක් ගැනීම ;

(ග) නිවසේ සිට පාසල දක්වාත් පාසලේ සිට නිවස දක්වාත් ගමන් කරන කාලය තුළ පමණක් ළමුන් වාහනය තුළ රඳවා ගත හැකි අතර අන් කිසිම වේලාවක ළමුන් වාහනයේ රඳවා නොගැනීමට වග බලා ගත යුතු ය;

(ඝ) නියාමන ආයතනයේ නියෝග රියදුරන් විසින් කඩ කිරීම අවසරපත්‍ර හිමිකරු විසින් නියෝග කඩකිරීමක් ලෙස සලකනු ලැබේ ;

(ඞ) සෑම දරුවකුම වාහනය තුළ හිංසාවෙන් ද, අපහසුතාවයෙන් ද තොරව අසුන් ගැන්වීමට අවශ්‍ය පහසුකම් සැලැස්විය යුතුය ;

(ග) පාසල ආරම්භ කරන වේලාවට පෙර කල් ඇතිව පාසල කරා ළමයා රැගෙන යාම ;

(ච) රථය තුළ ළමයාට යහපත් මානසිකත්වයකින් පාසල දක්වා ගමන් කිරීමට හා නැවත සිය නිවස වෙත ගමන් කිරීමට අවශ්‍ය කටයුතු සැළැස්වීමට වග බලා ගත යුතුය;

(ජ) ළමයා කිසිදු විටක වාහනය තුළ හුදකලා නොවීමට කටයුතු සැලැස්විය යුතුය;

(ඣ) ළමයකුට යම් හිංසාවක් හෝ අපයෝජනයක් සිදු වී ඇති බව දැන ගැනීමට ලදහොත් 1929 ළමා උපකාර සේවයට හෝ ආසන්නයේම ඇති පොලිස් ස්ථානයට වහාම දැනුම් දීමට කටයුතු කළ යුතුය;

(ට) වාහනය නවතා තබන ස්ථානය පිළිබඳ දෙමාපියන් හෝ භාරකරු හෝ පාසලේ පංති භාර ගුරුතුමා දැනුවත් කළ යුතුය ;

(ඨ) ළමයින්ගේ පැමිණීම පිළිබඳ විධිමත් වාර්තාවක් තබා ගත යුතුය.

එක් වාහනයක සිට තවත් වාහනයකට පාසල් ළමුන් හුවමාරු කර ප්‍රවාහනයේ යොදවන අවස්ථාවක යොදා ගන්නා සියලු වාහනවල හා රියදුරන් පිළිබඳ තොරතුරු දෙමාපියන් හා පාසල වෙත දැනුම් දී තිබිය යුතුය.

18. රියදුරුගේ වගකීම :-

(අ) රථයේ ගමන් ගන්නා සියලුම දරුවන්ගේ ආරක්ෂාව හා සුව පහසුව සහතික වන අයුරින් ධාවනය කළ යුතුය. (අධික වේගයෙන් ධාවනය කිරීම, වංගු ගැනීමේ දී හා ඉස්සර කිරීමේ දී වඩාත් සැලකිලිමත් විය යුතුය) ;

(ආ) අනුමත ළමුන් ප්‍රමාණය ඉක්මවා ප්‍රවාහනය නොකළ යුතුය ;

(ඇ) යහපත් හැසිරීම හා මනා කල් ක්‍රියාවෙන් යුක්ත විය යුතුය ;

(ඈ) මත්පැන් හෝ මත් ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් වැලකී සිටිය යුතුය ;

(ඉ) නියාමන ආයතනයේ ලියාපදිංචිය හා පුහුණුව ලබා ගැනීම ;

(ඊ) නියාමන ආයතනය විසින් පිළිගන්නා විනීත හා සංවර වූ ඇඳුමකින් සැරසී සිටිය යුතුය ;

(උ) රථය තුළ කිසිවිටකත් දුම් පානය නොකළ යුතුය ;

(ඌ) නියාමන ආයතනය විසින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත පැළඳ සිටිය යුතුය ;

(එ) ළමයෙකුගෙන් වරදක් සිදුවූ විට කිසිදු දඬුවම් පැමිණවීමක් හෝ සැර කිරීමක් නොකළ යුතු අතර දෙමාපියන්ට හෝ පාසල් ගුරුභවතෙකු වෙත දැනුම් දීම ;

(ඒ) ළමයාට ආචාරශීලීව කතා කළ යුතුය ;

(ඔ) අසභ්‍ය චිත්‍රපට පින්තූර, ගීත හෝ හඬපට, ජංගම දුරකථන මගින් ළමුන්ට පෙන්වීම, ඇසීමට සැළැස්වීම. ළමුන්ට දර්ශනය වන ආකාරයෙන් තබා ගැනීම නොකළ යුතුය.

19. රිය සහයක/සහයිකාවගේ වගකීම :-

(අ) පාසල් ප්‍රවාහන සේවයේ යෙදී සිටින කාල සීමාව තුළ ළමුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් දැඩිව ක්‍රියා කළ යුතු අතර ඒ පිළිබඳ සහතික විය යුතුය ;

(ආ) ප්‍රවාහනය කරන කාල සීමාව තුළ මත්පැන්, මත් ද්‍රව්‍ය හෝ දුම්වැටි භාවිතයෙන් වැළකිය යුතුය ;

(ඇ) ළමයකුගෙන් වරදක් සිදු වූ විට කිසිදු දඬුවම් පැමිණවීමක් නොකළ යුතු අතර, එවන් අවස්ථාවකදී දෙමාපියන් හෝ ගුරුභවතකු දැනුවත් කළ යුතුය ;

(ඈ) ළමුන් විෂයෙහි කාරුණිකව කතා විලාසයක් හා සංවරශීලිව හැසිරිය යුතුය ;

(ඉ) අසභ්‍ය චිත්‍රපට පින්තූර හෝ හඬපට ළමුන්ට පෙන්වීම, ඇසීමට සැළැස්වීම හෝ ළමුන්ට දර්ශනය වන ආකාරයෙන් තබා ගැනීම නොකළ යුතුය ;

(ඊ) හැසිරීම හා අපරාධවලට සම්බන්ධතාවයක් නැති ද යන්න තහවුරු කිරීමට අදාළ පොලිස් ස්ථානයෙන් සහතිකයක් ලබා ගත යුතුය ;

(උ) නිවසේ සිට පාසල දක්වාත්, පාසලේ සිට නිවස දක්වාත් ළමයි පිළිබඳ වගකීම දැරිය යුතුය ;

(ඌ) වාහනය තුළ වැහිකබා/කුඩ රැගෙන යාම.

20. දෙමව්පියන්ගේ වගකීම :-

(අ) වාහනය ළමුන් යැවීමට සුදුසු තත්වයේ පවතීදැයි පරීක්ෂා කිරීම වාහනය නියාමන ආයතනයක ලියාපදිංචි කළ වාහනයක් දැයි පරීක්ෂා කිරීම ;

(ආ) වාහන හිමියාගේ හා වාහන රියදුරාගේ සියලු තොරතුරු තමන් සතුව තබා ගැනීම ;

(ඇ) අදාළ වාහනයේ ප්‍රමිතියෙන් තොර අවස්ථාවකදී හෝ රියදුරාගේ චර්යා රටාව පිළිබඳ ගැටළු සහගත අවස්ථාවක් දුටුවිට නියාමන ආයතනයට පැමිණිලි කිරීම ;

(ඈ) ලබා ගන්නා සේවයේ අදාළ සේවා ගාස්තු ගිවිසගත් පරිදි වාහන හිමිකරුට ගෙවීම ;

(ඉ) ගාස්තු තීරණය කිරීමේ දී වාහන හිමිකරු හා දරුවාගේ දෙමාපියන් අතර ගිවිසුමක් ඇතිකර ගත යුතුය ;

(ඊ) බෝවන රෝගයක් වැළඳී සිටින දරුවකු රෝගය සුව වන තුරු වාහනයේ නොයැවිය යුතුය ;

(උ) අසනීපයෙන් යුත් දරුවකු වාහනයේ ගමන් කරවීමේදී රියදුරු හෝ වාහන හිමිකරු දැනුවත් කළ යුතුය ;

(ඌ) තම දරුවා පාසල වෙත රැගෙන යන වාහනයේ තොරතුරු පාසලේ විදුහල්පති මගින් පන්තිභාර ගුරුතුමා හෝ ගුරුතුමියට ලිඛිතව දැන්විය යුතුය ;

(එ) තම දරුවා පාසලට නොයන අවස්ථාවලදී, පාසලෙන් නියමිත වේලාවට පෙර හා පසුව රැගෙන එන අවස්ථාවල ඒ පිළිබඳව අදාළ රියදුරන් කල් වේලා ඇතුව දැනුවත් කළ යුතුය ;

(ඒ) අනවශ්‍ය ප්‍රමාදයක් ඇති නොවන සේ නියමිත වේලාවට දරුවා වාහනය වෙත භාරදීම.

21. පාසලේ වගකීම :-

(අ) ළමුන් පැමිණෙන වාහනවල විස්තර පාසල සතු විය යුතු අතර ළමුන් ආරක්ෂිතව අදාළ ප්‍රවාහන සේවාවලට භාරදීමට සැහීමකට පත්විය හැකි මට්ටමේ විධි විධාන සැලසිය යුතුවේ ;

(ආ) ගේට්ටුව අසලදී ළමුන්ගේ පැමිණීම හා පිටවීම නිරීක්ෂණය කළ යුතුය ;

(ඇ) පාසල් ආරම්භක වේලාවෙන් පසුව වාහනවලින් පැමිණෙන ළමුන් පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය ;

(ඈ) එම ළමුන්ගේ ගැටළුකාරී තත්ත්වයන් දුටුවිට දෙමාපියන් කැඳවා ඒ පිළිබඳ දැනුම් දිය යුතුය ;

(ඉ) ගැටලුකාරී අවස්ථාවකදී අදාළ නියාමන ආයතනයට පැමිණිලි කිරීමට කටයුතු කළ යුතුය.

21. නියාමන ආයතනයේ වගකීම :-

(අ) අදාළ මූලික අවශ්‍යතා පරීක්ෂා කර බලා සුදුසුකම් සපුරා ඇත්නම්, පාසල් ප්‍රවාහන සේවාවක් වශයෙන් ලියාපදිංචිය ලබාදීම ;

(ආ) රියදුරන් ලියාපදිංචි කර ගත යුතුයි ;

(ඇ) රියදුරන් සඳහා පුහුණු වැඩසටහනක් සැකසීම ;

(ඈ) පාසල් ළමුන් ප්‍රවාහනය සඳහා යෝග්‍යතා සහතික නිකුත් කිරීම රජයේ ලියාපදිංචි ඕනෑම ආයතනයකින් ලබා ගැනීමේ ක්‍රමවේදයක් සැකසීම ;

(ඉ) පාසල් ප්‍රවාහන සේවයක් ලෙස පහසුවෙන් හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් ලෙස ස්ටිකර් සකස් කර, එය මහජනතාවට හඳුන්වා දීම ;

(ඊ) බලපත්‍ර හිමියන් දැනුවත් කිරීමේ වැඩ සටහන් සැකසීම ;

(උ) වාහන සහයිකාවන් පුහුණු කිරීමේ වැඩ සටහන් සැකසීම ;

(ඌ) අදාළ පළාත් පාලන ආයතන සමග සම්බන්ධ වී වාහන ගාල් කිරීමේ ස්ථාන අවශ්‍ය පහසුකම් සහිතව සකසා දීම ;

(එ) ලැබෙන පැමිණිලි විභාග කර සාධාරණය ඉටු කිරීම ;

(ඒ) අවස්ථානුකූලව පාසල් ප්‍රවාහන සේවයේ යෙදෙන රථ පරීක්ෂා කිරීම රථගාල්වලදී පමණක් පරීක්ෂා කිරීමට ක්‍රමවේදයක් සැකසීම ;

(ඔ) නියාමන ආයතනය විසින් පාසල් ළමුන් ප්‍රවාහනයේ දී සිදුවන අපචාර අවම කර ගැනීම සඳහා නිරතුරුවම ළමා ආරක්ෂණ අධිකාරිය සමග සබඳතා පවත්වා ගත යුතුය ;

(ඕ) විධිමත් ගාස්තු සංශෝධන ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා පාසල් වෑන් රථ සංගම් සමග සාකච්ඡා කර තීරණයක් ගෙන කටයුතු කිරීමට නියාමන ආයතනයට බලය ඇත :

* කිසියම් විධිමත් ගාස්තු අය කිරීමේ ක්‍රමවේදයකට යටත්විය යුතු අතර ගාස්තු සංශෝධන කිරීම නියාමන ආයතනය මැදිහත් විය යුතුය.

(ක) රියදුරන් සඳහා හැඳුනුම්පතක් හඳුන්වා දීම ;

(ඛ) පාසල් ප්‍රවාහනය කරන වාහන සඳහා රක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දීම හා එම කටයුතු පවත්වාගෙන යාමට අදාළ කටයුතු සංවිධානය කිරීම ;

(ග) සියලුම පාසල් ප්‍රවාහනය කරන වාහන හිමියන් බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් අනුමත කරන ලද සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමයකට දායක විය යුතුය ;

මෙම නියාමනයන් උල්ලංඝණය කරන, පැහැර හරින හෝ නොසළකා හරින කිසියම් තැනැත්තෙක් අදාළ ගිවිසුම් කඩ කරනු ලබන්නෙකු බවට පත්වේ.

නියාමන ආයතනය විසින් බලය පවරන නිළධාරීන් හෝ පරීක්ෂක කණ්ඩායමක් විසින් කරනු ලබන පරීක්ෂණයකදී එකඟ වනු ලැබූ කොන්දේසි උල්ලංඝණය කර හෝ කඩකර ඇති අවස්ථාවකදී ඒ පිළිබඳ සංගම් සමග සාකච්ඡා කර සුදුසු පරිදි කටයුතු කිරීමේ බලය අදාළ නියාමන ආයතනය සතු වේ.

කෙසේ වෙතත් අදාළ නියාමන ආයතනය විසින් ලබා දෙනු ලබන තීරණ සම්බන්ධයෙන් පාසල් බස්හිමි සංගම් සමග සාකච්ඡා කිරීමට අධිකාරියට හැකියාව ඇත.

මෙම රෙගුලාසි මාලාවේ සිංහල, දෙමළ භාෂා අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එහිදී සිංහල පාඨය බලපැවැත්විය යුතුය.

අර්ථ නිරූපණය :

(i) අධිකාරිය යන්නෙන් අදහස් වන්නේ ඉහත ප්‍රඥප්තිය යටතේ බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය වේ ;

(ii) සංගම් යන්නෙන් අදහස් වන්නේ බස්නාහිර පළාත තුළ සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය යටතේ ලියාපදිංචි කරන ලද, ප්‍රවාහන අධිකාරිය විසින් හඳුනාගත් සංගම් වේ ;

(iii) පාසල් සේවා ප්‍රවාහන යන්නෙන් ළදරු ළමුන් ප්‍රවාහනයද ඇතුළුව සියළුම පාසල් ළමුන් ප්‍රවාහනය අදහස් වේ.

පළමුවැනි උපලේඛනය

| | | රු, ශත |
|---|---|---|
| 1. | මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍ර ගාස්තුව | 50.00 |
| 2. | නිත්‍ය මගී ප්‍රවාහන සේවා අවසර පත්‍ර ගාස්තුව | 500.00 |
| 3. | මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් පැවරීමේ ගාස්තුව | 500.00 |
| 4. | ලේබලය සඳහා | 30.00 |

දෙවැනි උපලේඛනය

| | | රු, ශත |
|---|---|---|
| 1. | වලංගු මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් සන්තකයේ තබා ගැනීම පැහැර හැරීම | 100.00 |
| 2. | අවසර පත්‍ර ලේබලය නියමිත පරිදි ප්‍රදර්ශනය නොකිරීම | 100.00 |
| 3. | බලයලත් නිළධාරියකු විසින් නියම කරනු ලබන උපදෙස් සහ සංඥා පිළිනොපැදීම | 100.00 |
| 4. | අවසරපත්‍ර ලේබලය වාමුවා වීදුරුවේ ප්‍රදර්ශනය නොකිරීම | 100.00 |
| 5. | අධිකාරිය විසින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත රියදුරු විසින් තම සන්තකයේ තබා නොගැනීම | 100.00 |
| 6. | අධිකාරිය විසින් මගී ප්‍රවේශපත්‍රධාරී වාහනය සම්බන්ධයෙන් ඉල්ලා සිටිනු ලබන ලේඛන වාර්තා විස්තර ඉදිරිපත් කිරීම පැහැර හැරීම | 100.00 |
| 7. | අධිකාරියේ ලියා පදිංචි නොකරන ලද රියදුරකු ලවා සිදු කරනු ලබන මගී ප්‍රවාහනය | 100.00 |

11 - 475

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.